**මගේ අංකය : සී.ප්‍රා.ස /1/5/2018,**

**සීතාවක ප්‍රාදේශීය සභාව,**

**හංවැල්ල.**

**2018.08.05.**

**සීතාවක ප්‍රාදේශීය සභාවේ,**

**ගරු සභාපති/උප සභාපති/ මන්ත්‍රී,**

**..................................................................................**

**මැතිතුමනි / මැතිතුමියනි,**

**2018 අගෝස්තු මස මහා සභා රැස්වීම – 05 වන මහා සභාව.**

**සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018 අගෝස්තු මාසයට නියමිත 05 වන මහා සභා රැස්වීම 2018.08.10 වන සිකුරාදා දින, පෙ.ව. 10.00 ට සීතාවක ප්‍රාදේශීය සභාවේ සභා ශාලාවේ දී පැවැත්වේ.**

**එදිනට ඔබතුමාගේ / ඔබතුමියගේ පැමිණීම ගෞරවයෙන් බලාපොරොත්තු වෙමි.**

**මෙයට,**
**ගරු සභාපතිතුමාගේ නියමය පරිදි,**

**කේ.ඒ. චන්දන පද්මසිරි,**
**ලේකම්,**
**සීතාවක ප්‍රාදේශීය සභාව,**
**හංවැල්ල.**

## න්‍යාය පත්‍රය.

**01. පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කර ගැනීම.**

**02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

**03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරිම.**

**04.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

<u>**04 – (01)** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරයි.</u>

<u>සමුපකාරයට දේපල බදු දීම හා පොලිය ලබා ගැනීම.</u>

1. කහහේන වෙළඳ සංකීර්ණයෙන් සමුපකාරයට දී තිබෙන කඩය සඳහා ගිවිසුමක් තිබේද?
2. ගිවිසුම් ප්‍රකාරව කඩ කුලිය ලැබී තිබේද?
3. හිගයක් තිබේ නම් මාස කීයක මුදල්ද?
4. මීපේ නගරයේ සමුපකාරයට දී තිබෙන දේපල සඳහා ගිවිසුමක් තිබේද?
5. එහි මුදල් නිසි පරිදි ගෙවා තිබේද? හිග ඇත්නම් ඒ මාස කීයකද?
6. හංවැල්ල වෙළඳ සංකීර්ණයේ සමුපකාරයට දී තිබෙන කඩය සඳහා ගිවිසුමක් තිබේද?
7. ඒ සඳහා ගෙවිය යුතු මුදල් නිසි පරිදි ගෙවා තිබේද? හිග තිබේ නම් ඒ මාස කීයකද?

**05.** යථා පරිදි කල් දී ඇති යෝජනා.

<u>**05 – (01)** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දැනට පවතින අත්පන්දු ක්‍රීඩාව ක්‍රීඩාවට උචිත ලෙස නවීකරණය කර සංවර්ධනය කිරිමට හා ක්‍රීඩකයින්, පුහුණුකරුවන්, විනිසුරුවන් පුහුණු කිරිම සඳහා විශේෂ වැඩසටහනක් දියත් කිරිම, ප්‍රදේශයේ තෝරාගත් සීමාවල තම අත්පන්දු ක්‍රීඩා පිටි සකස් කර ප්‍රවර්ධන සඳහා ප්‍රවර්ධන කටයුතු කිරිමට වැඩ පිළිවෙලක් සකස් කර දියත් කිරිම සඳහා මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>**05 – (02)** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

තුන්නාන **444** නැගෙනහිර ග්‍රාම සේවා වසමේ ප්‍රධාන මාර්ගය වන වත්ත කඩේ හන්දිය සිට **69** කන්ද දෙසට හැරෙන හතරමං හන්දිය දක්වා ඇති මාර්ගය තුන්නාන මහ කන්ද මාර්ගය නමින් හඳුන්වනු ලබයි.

මෙම මාර්ගයට අපේක්ෂා වැඩිහිටි සමිතිය මගින් ගම්වාසින්ගේ එකගතාවය මත "අපේක්ෂා මාවත" ලෙස නම් කිරිම සුදුසු යැයි ඔවුන්ගේ සමිතියේ එකගතාවයද හිමි වී ඇත. ඔවුන්ගේ ඉල්ලීම පරිදි මෙම මාර්ගය "අපේක්ෂා මාවත" යනුවෙන් නම් කිරිම සුදුසු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>**05 – (03)** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩී. අයෝම මධු ප්‍රසාද් මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

**1987** දී පළාත් පාලන පනත තුළින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් ප්‍රාදේශීය සභාවක් පිහිටුවිය යුතු යැයි යෝජනා කෙරිනි. එම වකවානුයේ අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාසය තුළ ක්‍රියාත්මක වූයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පමණි. නමුත් ජනග්‍රහනය, භූමිය හා අනෙකුත් අවශ්‍යතා මුල් කර ගනිමින් වර්තමානය වන විට පාදුක්ක හා සීතාවක ලෙස ප්‍රාදේශිය ලේකම් කාර්යාල දෙකකට අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාසය නිර්මාණය වී ඇත. පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හෝමාගම මැතිවරණ කොට්ඨාසයෙන්ද ග්‍රාම සේවා වසම් **10** ක් ඇතුළත් වී ඇත. අවම සංවර්ධන ක්‍රියාවලියක් පාදුක්ක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වීමට ප්‍රධාන හේතුව ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පළාත් පාලන ආයතනයක් නොමැති වීම හඳුනා ගත

හැකිය. මීළඟ පළාත් පාලන මැතිවරණයට පෙර පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මුල් කර ගනිමින් නව ප්‍රාදේශීය සභාවක් පාදුක්ක ප්‍රාදේශිය සභාව ලෙස පිහිටු විය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

පහත පුද්ගලයින් සදහා මෙම යෝජනාව සම්මත වීම/නොවීම පිළිබද පිටපත් යොමු කරන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිමි. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කථානායකතුමා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා, බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා, බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමා, බස්නාහිර පළාත් පාලන කොමසාරිස්තුමිය, පාදුක්ක හා සීතාවක සංවර්ධන කමිටුව.

<u>05 – (04) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

ලාංකීය රාජාවලියේ මායාදුන්න රජතුමාගේ හා සීතාවක රාජසිංහයන්ගේ රණකාමිත්වයෙන් ඔපවත් වූ සීතාවක රාජධානි සමය ලක් ඉතිහාසයේ අභිමානවත් යුගයකි. සීතාවක යුගය හා සම්බන්ධ පුරා විද්‍යාත්මක ස්මාරක රැසක් අප බල ප්‍රදේශය තුළ පිහිටා ඇත. එමෙන්ම සීතාවක යුගය දක්වා දිව යන සටන් ක්‍රම, දේශීය වෙදකම, සාහිත්‍ය නිර්මාණ, යුධ උපක්‍රම වැනි ක්ෂේත්‍ර වලද ජනතාවගේ අවධානයට ලක් විය යුතු කරුණු ගණනාවක් හදුනා ගත හැකියි. සීතාවක රාජධානි සමයට සම්බන්ධ ඓතිහාසික තොරතුරු සීතාවක ප්‍රදේශයේ ජනතාවට මෙන්ම අනෙකුත් ප්‍රදේශ වල ජනතාවට දැන ගැනීමට, සංරක්ෂණය කිරිම හා අධ්‍යයනය කිරිමට හැකි වන පරිදි පුරා විද්‍යාත්මක කෞතුකාගාරයක් සදහා සීතාවක ප්‍රාදේශීය සභාවේ හංවැල්ල නගරය තුළ පිහිටි ඓතිහාසික හංවැල්ල බලකොටුව ආශ්‍රිතව සීතාවක ප්‍රාදේශීය සභාව සතු පැරණි සතිපොළ භූමි කොටසක කෞතුකාගාරයක් ගොඩනැගිය යුතු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>05 – (05) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාලනී චන්ද්‍රලතා මැතිතුමිය විසින් යෝජනා කරයි.</u>

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 435/බී කහටපිටිය ග්‍රාම නිලධාරි වසමේ පාසල් මාවත අතුරු මාර්ගයේ පළමුව හමුවන දකුණට ඇති මුත්තන්වත්ත මාර්ගය පාසල් මාවත අතුරු මාර්ගයෙන් ආරම්භ වී L.A.D.K.P ධර්මප්‍රිය මහතාට අයත් පෞද්ගලික ඉඩමෙන් අවසන් වන දිග මීටර් 154.8 හා පළල මීටර් 3.00 වන මුත්තන්වත්ත මාර්ගය හා මුත්තන්වත්ත මාර්ගයෙන් ආරම්භ වී බී. සුසිලාවතී මහත්මියට අයත් පෞද්ගලික ඉඩමෙන් අවසන් වන දිග මීටර් 24.3 හා පළලින් මීටර් 3.00 වන මුත්තන්වත්ත පළමු අතුරු මාර්ගයද ප්‍රාදේශීය සභාව පවරාගෙන සංවර්ධනය කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>05 – (06) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

2018.05.11 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 05 (06) යටතේ මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මා වෙත ගෙවීම් කිරිමට පවරන ලද බලය අනුව මා විසින් කරන ලද පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ගෙවීම් ඊට අනුරූපිව ඇති ගෙවීම් ලබන්නා වෙත ඊට ඉදිරියෙන් දක්වා ඇති මුදල ගෙවීම අනුමත කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| දිනය | වවුචර් අංකය හා දිනය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 2018.05.09 | 833-836<br>18/05/09 | 2018 අප්‍රියෙල් මස සීතාවක ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ හා උප කාර්යාල 4 හි සේවයේ යෙදී සිටි ආදේශක සේවකයින් 75 දෙනෙකු සදහා දෛනික වැටුප් ගෙවීම. | 1,668,591.50 |
| 2018.05.23 | 985-989<br>18/05/23 | 2018 මැයි මස සීතාවක ප්‍රාදේශීය සභාවේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවකයින් 190 ක් සදහා මාසික වැටුප් ගෙවීම. | 6,732,479.74 |

| | | | |
|---|---|---|---|
| **2018.06.08** | **1112-1116**<br>**18/06/08** | සීතාවක ප්‍රාදේශීය සභාවෙහි **2018** මැයි මස ප්‍රධාන කාර්යාලයේ හා උප කාර්යාල **4** හි සේවයේ යෙදී සිටි ආදේශක සේවකයින් **78** දෙනෙකු සඳහා දෛනික වැටුප් ගෙවීම. | **2,003,757.51** |
| **2018.06.22** | **1216-1220**<br>**18/06/22** | **2018** ජුනි මස සීතාවක ප්‍රාදේශීය සභාවේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවකයින් **188** ක් සඳහා මාසික වැටුප් ගෙවීම. | **6,698,846.44** |
| **2018.07.24** | **1481 -1485**<br>**18/07/24** | **2018** ජූලි මස සීතාවක ප්‍රාදේශීය සභාවේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවකයින් **188** ක් සඳහා මාසික වැටුප් ගෙවීම. | **6,658,310.86** |

**05 – (07) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

**2018 අයවැය ලේඛනයට අනුව පහත උප ලේඛනයේ සඳහන් ප්‍රතිපාදන අවශ්‍යා වන වැය ශීර්ෂයන්හි 2018 වර්ෂයට වෙන් කර තිබූ ප්‍රතිපාදන අවසන් වී ඇති බැවින් 2018 වර්ෂය සඳහා තවදුරටත් ඉටු කළ යුතු කාර්යයන් සඳහා අවශ්‍යය ප්‍රතිපාදන උප ලේඛනයේ ඊට ඉදිරියේ දක්වා ඇති වැය ශීර්ෂයෙන් මාරු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

| ප්‍රතිපාදන අවශ්‍යා වැය ශීර්ෂය | 2018 වර්ෂයට වෙන් කර තිබූ ප්‍රතිපාදන මුදල රු. | තව දුරටත් වෙන් කළයුතු ප්‍රතිපාදන මුදල රු. | ප්‍රතිපාදන ලබා ගන්නා වැය ශීර්ෂය | ලබා ගන්නා ප්‍රතිපාදන මුදල රු. | ප්‍රතිපාදනලබා ගන්නා වැය ශීර්ෂයේ තව දුරටත් ඉතිරි වන මුදල රු. |
|---|---|---|---|---|---|
| 105(6)<br>පුහුණු වැඩසටහන් | **100,000.00** | 300,000.00 | 101(9)1<br>වෙනත් දීමනා | 300,000.00 | **779,575.75** |
| 109(2)<br>ලී බඩු හා කාර්යාල උපකරණ | **3,800,000.00** | 460,000.00 | 109(1) මෝටර් රථ මිලදී ගැනීම | 460,000.00 | **540,000.00** |
| 205(3)1<br>විදුලිය | **127,000.00** | 70,000.00 | 101(9)1<br>වෙනත් දීමනා | 70,000.00 | **709,575.75** |
| 604(1)<br>වාහන හා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | **10,000.00** | 50,000.00 | 104(1)<br>වාහන හා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 50,000.00 | **3,218,931.93** |
| 609(2)<br>පුස්තකාල හා වෙනත් උපකරණ | **850,000.00** | 140,000.00 | 109(1)<br>මෝටර් රථ මිලදී ගැනීම | 140,000.00 | **400,000.00** |
| | | **1,020,000.00** | | **1,020,000.00** | |

**05 – (08) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

**සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කළ යුතු පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ව්‍යාපෘති ඊට අනුරූපව ඇති කොන්ත්‍රාත් සමිති/ ආයතන/ පුද්ගලයින් සමග ඊට ඉදිරියේ දක්වා ඇති ඇස්තමේන්තු**

මුදල අනුව ගිවිස ගනිමින් ඊට ඉදිරියෙන් දක්වා ඇති කොන්ත්‍රාත් ආයතනය සමග ගිවිස ගනිමින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංක | ව්‍යාපෘතිය | මූල්‍ය සම්පාදනය | කොන්ත්‍රාත් සමිතිය/ ආයතනය/ පුද්ගලයා | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|---|---|
| **1** | වග ගැමුණු මාවත සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>සුහද මිතුරු සංසදය,<br>වග ඉරිදාපොළ,<br>තුම්මෝදර. | **282,740.20** |
| **2** | ජයන්ති මාවත පළමු පටුමග සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>461, පාදුක්ක ග්‍රාම සංවර්ධන සමිතිය. | **287,097.87** |
| **3** | පොහොරබාව වත්ත උඩ පාර සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>428/සී, මිරිස්වත්ත ගොවි සංවිධානය. | **114,406.20** |
| **4** | බැරේගල ප්‍රජා ශාලාව අසල මාර්ගය සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>428/ඒ, අළුත් අම්බලම ග්‍රාම සංවර්ධන සමිතිය. | **174,849.56** |
| **5** | බෝපෙ පාර කැඩී ඇති රුදවුම් බැම්ම කොටස ඉදිකිරිම. | සභා අරමුදල් | සභාපති,<br>459/බී, සියඹලාව ගොවි සංවිධානය. | **800,000.00** |
| **6** | ජනශක්තිගම ප්‍රධාන මාර්ගයේ මැද කොටස සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>459/බී, සියඹලාව ගොවි සංවිධානය. | **285,407.56** |
| **7** | බ්‍රැන්ඩිගම්පල බාලගේවත්ත පාර අබලන් බෝක්කුව හා පැති බැම්ම ඉදිකිරිම. | සභා අරමුදල් | සභාපති,<br>බ්‍රැන්ඩිගම්පල වැඩිහිටි සමිතිය. | **336,824.68** |
| **8** | ඇස්වත්ත මුණ්ඩිගල කන්ද මාර්ගය සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>ඇස්වත්ත උතුර එක්සත් සුභ සාධක සමිතිය. | **317,434.82** |
| **9** | පිටුම්පෙ දකුණ සෝමානන්ද මාවත සිට කොටිගලහේන ඉඩම ඇති මාර්ගයේ කොටසක් අළුත්වැඩියා කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>පිටුම්පෙ ඒකාබද්ධ ගොවි සංවිධානය. | **285,566.28** |
| **10** | සීතාවක ප්‍රාදේශීය සභාව සතු වාහන ගාල් කිරීමේ අංගනයක් ඉදිකිරිම. | පළාත් නිශ්චිත | සභාපති,<br>හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය. | **999,572.23** |
| **11** | කඩුගොඩ පල්ලිය ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>430, කඩුගොඩ උතුර ග්‍රාම සංවර්ධන සමිතිය. | **289,187.82** |
| **12** | පුවක්පිටිය වේරගොල්ල පළමු පටුමග සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>වේරගොල්ල ප්‍රජා සේවා කේන්ද්‍රය,<br>වේරගොල්ල,<br>පුවක්පිටිය. | **162,852.16** |
| **13** | යටවතුර කහවල මාර්ගයේ කොටසක් අළුත්වැඩියා කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>කහවල ග්‍රාම සංවර්ධන සමිතිය. | **285,751.03** |
| **14** | අංගමුව මාර්ගයේ මීරියගල්ල පාර අසල බෝක්කුව පුළුල් කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>වේරගල ගොවි සංවිධානය. | **410,000.00** |

| | | | | |
|---|---|---|---|---|
| 15 | හංවැල්ල උත්සව ශාලාවට ජල සැපයුම ලබා දීම. | සභා අරමුදල් | සභාපති,<br>හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය. | 64,934.75 |
| 16 | කහටපිටිය ප්‍රජා ශාලාව ඉතිරි වැඩ නිම කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>කැළණි නදී වැඩිහිටි සංවිධානය,<br>කහටපිටිය. | 416,492.11 |
| 17 | පාදුක්ක ජයන්ති මාවත පොදු අතුරු මාර්ගය සංවර්ධනය කිරිම. | පළාත් සංවර්ධන | සභාපති,<br>461, පාදුක්ක ග්‍රාම සංවර්ධන සමිතිය. | 574,495.98 |
| 18 | පාදුක්ක ප්‍රා.ලේ කොට්ඨාසයට අයත් පාදුක්ක කුමාර මාවතේ ඇති පොදු අතුරු මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරිම. | පළාත් සංවර්ධන | සභාපති,<br>461, පාදුක්ක ග්‍රාම සංවර්ධන සමිතිය | 344,444.24 |
| 19 | උග්ගල්ල දුම්රියපල අසල ෆවුසි මාර්ගය කොටසක් සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>උග්ගල්ල ජනශක්ති ගොවි සංවිධානය. | 286,668.84 |
| 20 | කොස්ගම සතිපොළ මාළු වෙළඳසැල ඉදිරිපිට ජල බැස යන කාණුව තැනීම.<br>(2018.07.10 දින මහා සභාවේ 05 (10) - 22 තීරණයේ සදහන් රු.55,412.75 ක ඇස්තමේන්තු මුදල සංශෝධනය කිරිම.) | සභා අරමුදල් | සභාපති,<br>කැළණි මිටියාවත 427 පහළ කොස්ගම නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය,<br>කොස්ගම. | 111,725.00 |
| 21 | කොස්ගම ප්‍රිමික්ස් අංගනයේ වහලය අළුත්වැඩියා කිරිම.<br>(2018.07.10 දින මහා සභාවේ 05 (10) - 16 තීරණයේ සදහන් රු.150,268.20 ක ඇස්තමේන්තු මුදල සංශෝධනය කිරිම.) | සභා අරමුදල් | සභාපති,<br>කැළණි මිටියාවත 427 පහළ කොස්ගම නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය,<br>කොස්ගම. | 294,188.40 |
| 22 | නැණසල ආවරණ තාප්ප තීන්ත ආලේප කර අළුත්වැඩියා කිරිම.<br>(2018.06.11 දින මහා සභාවේ 05 (04) - 08 තීරණයේ සදහන් රු.119,533.16 ක ඇස්තමේන්තු මුදල සංශෝධනය කිරිම.) | සභා අරමුදල් | ඍජු ශ්‍රමික | 160,628.00 |
| 23 | හංවැල්ල පුස්තකාල ගොඩනැගිල්ලේ කමිටු රැස්වීම් ශාලාවේ අභ්‍යන්තර වෙන් කිරිම. ( වැඩ කුලිය) | සභා අරමුදල් | සභාපති,<br>443/බී, හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය. | 36,795.97 |
| 24 | හංවැල්ල නොදිරන කසල මධ්‍යස්ථානයේ - ගොඩනැගිලි කොටස් එක් කිරිම හා වැඩි දියුණු කිරිම. | සභා අරමුදල් | ඍජු ශ්‍රමික | 1,290,801.82 |

**05 – (09) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

කහහේන සුසිරිවර්ධනාරාමය සහ උඩ මාපිටිගම ගංගාරාමය යන උභය විහාරාධිපති අති පූජ්‍ය කහහේනේ මේධානන්ද නායක ස්වාමීන් වහන්සේ විසින් අඩ සියවසක් පුරා සිදු කරන්නට යෙදුණා වූ ආගමික හා සමාජයීය මෙහෙවර වෙනුවෙන් උපහාර පිදීමේ මහෝත්සවය සඳහා රු. 100,000.00 ක ආධාර මුදලක් අති පූජ්‍ය මේධානන්ද ස්වාමීන් වහන්සේ වෙත ලබා දිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**05 – (10) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

සීතාවක ප්‍රාදේශිය සභාවේ පාදුක්ක පැරණි වෙළඳ සංකීර්ණයේ බී.එච්.එම්. පියසේන යන අය නමින් ඇති අංක 04 දරණ කඩ කාමරයේ අයිතිය ඔහුගේ දියණිය වන පාදුක්ක, සේනානායක පෙදෙස, අංක 15/23 හි පදිංචි බී.එච්.එම්. ඩී. සුරංගනී යන අයට පැවරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**05 – (11) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුසන්ත මැතිතුමා විසින් යෝජනා කරයි.**

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 443/ඩී ජයවීරගොඩ ග්‍රාම නිලධාරි වසමේ ජයවීරගොඩ ගුළුහේන පාරේ පළමුව හමුවන දකුණට ඇති මාර්ගය වන 2014.10.31 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ගැසට් පත්‍රයේ අංක 25 යටතේ සදහන් ජයවීරගොඩ ගුළුහේන පාර ජයවීරගොඩ පාරෙන් ආරම්භ වී පෞද්ගලික ඉඩමෙන් අවසන් වන මීටර් 700 දිග මීටර් 4.4 පළල මාර්ගය "ජයවීරගොඩ නා සෙවණ" පාර ලෙස නම් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**05 – (12) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා විසින් යෝජනා කරයි.**

ග්‍රාමීය ආර්ථිකය නැංවීම හා කුඩා පරිමාණ ගෙවතු වගාව නගා සිටුවීමත් හා දිරිමත් කිරිම තුළින් ආර්ථිකයේ කුඩාම ඒකකය වන කුටුම්භය තුළට වැඩි ආදායමක් උත්පාදනය කිරිම අරමුණු කරගත් සීතාවක ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන පාදුක්ක සතිපොලෙහි දැනට පොළ පැවැත්වෙන දින දෙකට අමතරව තවත් සුදුසු දිනයක් හා වේලාවක් මසකට වරක් වෙන් කරවා ග්‍රාමීය ගෙවතු වගාවන්හි ඵලදාව මෙන්ම ගෘහාශ්‍රිතව කෙරෙන නිෂ්පාදනයන් අතරමැදියන්ගෙන් තොරව අලෙවි කිරිම සදහා ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස 26 ම ආවරණය වන පරිදි ක්‍රමවේදයක් ඔස්සේ නියමු වැඩසටහන් ලෙස මාසික පොළක් සංවිධානය කර ක්‍රියාත්මක කිරිමට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**06.කාරක සභා වාර්තා.**

**06 – (01 ) 2018.07.20** නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 – (02 ) 2018.07.23** කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 – (03 ) 2018.07.24** පරිසර හා පහසුකම් කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 - (04) 2018.07.26** මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 - (05) 2018.07.26** ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**07.ලැබීම් හා වියදම් පිළිබද මාසික ප්‍රකාශ.**

**07 – (01) 2018** ජුනි මාසය ලැබීම් හා වියදම් පිළිබද ප්‍රකාශය.

**08.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ප්‍රකාශ.